ISSN 2386-1835

VERITÉ

# විදසුන්

වෙළුම 07 - කාණ්ඩය 02 2019 දෙසැ

2019 වසරේ අයවැයෙන් යෝජනා කළ මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සියලුම සිගරට් සන්නාමයන්ගේ මිල තර්කානුකූල පදනමක් යටතේ නැවත නියම කිරීමට කටයුතු කිරීම හරහා 2020 වසර සඳහා සිගරට් බදුවලින් අමතර රුපියල් බිලියන 20ක් උපයා ගැනීමට රජයට හැකියාව තිබේ. එහිලා, ප්‍රතිපත්තිමය පදනමක සිට, ආදායම සහ විකල්පයන්වල බලපෑම සහ ඒවායේ සම්බන්ධය මෙම විදසුනෙන් ගවේෂණය කෙරේ.

අනීෂා ගුරුගේ
**අධ්‍යනය**

නිශාන් ද මෙල්
**විදසුන් මාලා සංස්කාරක**

VERITÉ RESEARCH
Strategic Analysis for Asia

රුපියල් බිලියන
**100**
සිගරට් බදුවලින් රජයට හිමිවන වාර්ෂික ආදායම

රුපියල් බිලියන
**20**
මිල තීරණය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව බදු වෙනස් කළහොත් ආදායමේ අපේක්ෂා කළ හැකි ඉහළ යාම

මිල නම්‍යතාවය (සිගරට්)
**-0.5**
10% කින් මිල ඉහළ යන විට පරිබෝජනය 5% කින් පහළ වැටෙන බව මෙහි අදහසයි



# දර්ශකයකට අනුව දුම්වැටි බදු අය කරන්නට කටයුතු කලොත් 2020දී රජයට රුපියල් බිලියන 20 ක අමතර ආදායමක්

කෝවිඩ් -19 වෛරසය පැතිරීම අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රී ලංකා රජය අයවැය හා ආදායම් අර්බුදයකට මුහුණ දී තිබේ. මෙම අර්බුදයේ බොහෝ අවාසි පැවතුනත්, මෙම තත්ත්වය, ඇතැම් පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් අනුව කටයුතු කිරීමෙන් ඈත් වී, දුම්වැටි බදු ක්‍රියාත්මක කරන ආකාරය ක්‍රමවත් කිරීමට රජයට හොඳ අවස්ථාවක් ලෙස භාවිත කල හැකිය. මෙම විශ්ලේෂණය පෙන්වා දෙන්නේ ලංකාවේ දුම්වැටි බදු සහ මිල ගණන් ඉහල දැමීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ මූල ධර්ම වලට අනුකූලව සිදු වී නොමැති බවයි. රට රාජ්‍ය මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබෙන අවස්තාවක උදාවන, මැයි 31 වන දිනට යෙදී තිබුන ලෝක දුම්කොළ විරෝධී දිනය අපට සිහිපත්කර දෙන්නේ දුම්වැටි බදු ක්‍රමානුකූලව ඉහල දැමීමට අසමත් වීම ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තියේ බරපතල අසාර්ථකත්වයක් බව යි.

වෙරිටේ රිසර්ච් විසින් සිදුකල පෙර විශ්ලේෂණයන් මගින් සමාජ හා මූල්‍ය අවශ්‍යතා වලට ගැලපෙන පරිදි ක්‍රමානුකූල ක්‍රමවේදයකට අනුව දුම්වැටි බදු පැනවීමට ශ්‍රී ලංකාවේ රජයන් නිරන්තරයෙන් අසමත් වී ඇති ආකාරය පෙන්වා දී තිබේ. බදු වැඩි කිරීම සහ ඒ හරහා දුම්වැටි මිල ඉහල යාම, සමාජයට හිතකර සෞඛ්‍ය ප්‍රතිඵල ලබා දීමට හේතු වනවා මෙන්ම රාජ්‍ය ආදායම ඉහල නංවා ගැනීමටද උපකාරී වේ.

"Cigarette Tax Indexation, Getting it Right and Getting it Wrong "(ඩේලි මිරර්, 2019 මැයි), යන මැයෙන් පල වූ විශ්ලේෂණය මගින් පෙන්වා දුන්නේ උද්ධමනය හා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පදනම් කරගත් දර්ශකයකට අනුව දුම්වැටි බදු ක්‍රමානුකූලව ඉහළ නැංවීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දීමෙන්, 2019 අයවැය දුම්වැටි බදු තීරණය කිරීම සම්බන්ධයෙන් නිවැරදි දිශාවට පියවරක් තැබූ බවය. එය ඊට පෙර සාමාන්‍යකරනය වී පැවති, නියමිත ක්‍රියා පටිපාටියකින් තොරව, ප්‍රමාද වී කරනු ලැබූ බදු වෙනස්කිරීමේ ප්‍රතිපත්තියේ වැරදි අර්ධ වශයෙන් හෝ නිවැරදි කිරීමට ගත් පියවරක් ලෙස සැලකිය හැක. ගත් පියවර යහපත් වුවද, එය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවී අතරමග නැවතිණි. 2019 දෙසැම්බරයේ ප්‍රකාශයට පත් කළ දුම්වැටි සඳහා වූ බද්ද වැඩි කිරීම පවා සැලසුම් කර ඇත්තේ හුදෙක් වැට් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කිරීමෙන් සිදු වූ බදු ආදායම අහිමි

වීම පියවා ගැනීමට මිස 2019 අයවැයෙන් රජයේ ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කළ දර්ශකයක් අනුව බදු අය කිරීම ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයක් ලෙස නොවේ.

මෙම විශ්ලේෂණයෙන් පෙන්වා දෙන්නේ, 2019 අයවැයෙන් දක්වා ඇති දර්ශකයක් අනුව බදු අය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව බදු සකස් කිරීමෙන් සහ වෙළඳපොලේ විවිධ වෙළඳ නාම යටතේ අලෙවි වන සියලු දුම්වැටි වලට මෙම බදු පැනවීමට කටයුතු කිරීමෙන්, 2020 වසරේ දී රජයට දුම්වැටි බදු ආදායම තුලින් අමතර රුපියල් බිලියන 20 ක් එකතු කරගත හැකි වන බවයි.

දරශයකයට අනුව ක්‍රමානුකූලව බදු අය කිරීමේ ප්‍රවේශයේ පදනම මූලික ආර්ථික සංසිද්ධි දෙකකින් උකහා ගන්නා ලද්දකි: ඒවා නම් තනි පුද්ගල පරිභෝජන තීරණ වලට ආදායම නිසා වන බලපෑම සහ ආදේශන වල මිල ගණන් නිසා වන බලපෑමයි. . දුම්වැටි බදු තීරණයේදී, මෙම ආදායම් සහ ආදේශන වල බලපෑම නොසලකා හැරීම, දුම් වැටි බදු හරහා ලබා ගත හැකි ආදායමට අහිතකර ලෙස බලපායි. අවාසනාවකට මෙන්, මෙම ප්‍රතිපත්තිමය වැරදි අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ දුම්වැටි සඳහා වූ බදු වෙනස් කිරීම්වල සාමාන්‍ය සම්මතයක් බවට පත්ව තිබේ.

## ආදායම් නිසා වන බලපෑම් මොනවා? එම බලපෑම් දුම් වැටි බදු තීරණයට මග පෙන්වන්නේ කෙසේද?

ආර්ථික විද්‍යාවේ ආදායම නිසා වන බලපෑම ලෙස දක්වන්නේ භාණ්ඩ මිලදී ගැනීම හැකියාව ඉහල යනවිට, පරිභෝජයනය ඉහල යාමේ ප්‍රවනතාවයයි. භාණ්ඩයේ මිල අඩු වීම හෝ පුද්ගලයාගේ ආදායම වැඩිවීම, භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව වැඩි වීමට හේතු වේ.. ආර්ථික විද්‍යාඥයින් විසින් 'සාමාන්‍ය භාණ්ඩ' ලෙස හඳුන්වන භාන්ඩ සහ ආදායම අතර ඇත්තේ ධනාත්මක සම්බන්ධයකි. එනම් මිලදී ගැනීමේ හැකියාව වැඩි වන විට එම භාණ්ඩ පරිභෝජයන වැඩි වේ. එහෙත් "බාල භාණ්ඩ" ලෙස හඳුන්වන භාණ්ඩ සහ ආදායම අතර ඇත්තේ මීට ප්‍රතිවිරුද්ධ සම්බන්ධයකි. නිදසුනක් වශයෙන්, ඔබේ ආදායම ඉහළ යන විට, ඔබ ත්‍රී රෝද රථ සහ කුලී රථ තෝරා ගැනීම නිසා ඔබ විසින් බස් ටිකට්පත් අඩු ප්‍රමාණයක් මිල දී ගැනීමට ඉඩ තිබේ.

1 වන රූපයෙන් දැක්වෙන්නේ ජ්‍යෙෂ්ඨ ලෙස දක්වා ඇති ජෝන් ප්ලේයර් ගෝල්ඩ් ලීෆ් නම් වෙළඳනාමය සහිත වැඩිපුරම පරිභෝජනය කරන දුම්වැටිවල මිලදී ගැනීම හැකියාව පසුගිය දසක තුන තුල ඉහල ගොස් ඇති ආකාරයයි. මෑත වසරවල දී මිලදී ගැනීම හැකියාව අඩු වී ඇති නමුත්, 1980 සිට 2000 දක්වා වූ දශක දෙකෙහි මිලදී ගැනීම හැකියාවට වඩා ඉහල මට්ටමක පවතී. එම කාලයෙන් පසුව රජයේ ප්‍රතිපත්ති ලිහිල් වීමත් වීමත් සමග මිලදී ගැනීමේ හැකියාව ඉහල ගොස් ඇත. ජ්‍යෙෂ්ඨ බදු ප්‍රමාණය බණ්ඩ 7.20 කින් පමණ වැඩි කිරීමෙන්, (ඊට සමානව මිලෙහි වැඩි වීමක් සිදු වේ යැයි යන උපකල්පනය මත), මිලදී ගැනීමේ හැකියාව, පෙර පැවති සාදනිය මට්ටමට ගෙන ඒමට රජයට හැකි වනු ඇත.

පාරිභෝගික ඉල්ලුම, මිලට දක්වන නම්‍යතාවය, එනම් මිල වැඩි වන විට පරිභෝජනය කොපමණ අඩු වේද? යන්න මේ හා සබැඳි, සළකා බැලිය යුතු තවත් වැදගත් කරුණකි. . ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තරව ද දුම්වැටි සඳහා මිල නම්‍යතාවය 1 ට වඩා අඩු බව පර්යේෂණ මගින් නැවත නැවතත් පෙන්වා දී තිබේ. පවතින පර්යේෂණ අනුව එය - 0.5 කට ආසන්න වේ. මෙයින් අදහස් කරන්නේ මිල 10% කින් ඉහළ ගිය විට පරිභෝජනය පහත වැටෙන්නේ 5% ක් පමණක් බව යි. ඒ අනුව, මිලෙහි වැඩි වීම, පරිභෝජනයේ වන අඩු වීම ඉක්මවා යන නිසා, මිල ඉහල දමන සෑම අවස්ථාවකම සමස්ත ආදායම ඉහල යයි. එයින් අදහස් වන්නේ මිල වැඩි වීම බදු වැඩිවීමක් නිසා සිදුවන්නේ නම් පරිභෝජනය අඩු වුව ද එකතු කරන ලද මුළු බදු ප්‍රමාණය ද ඉහළ යන බව යි.

දුම් වැටි බදු වැඩි කිරීම තුලින්, මිල දී ගැනීමේ හැකියාව අඩු කිරීම සහ පර්භෝජයන අඩු කිරීම මුලිකව සෞඛ්‍ය හේතූන් සමග සබැඳුනද, වර්තමානයේ එය රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන්ද වැදගත් වේ. දුම් වැටි සම්බන්ධ මිල නම්‍යතාවය 1 ට වඩා අඩු බැවින් බදු වැඩි වන විට බදු ආදායම වැඩි වනු ඇත. 2019 අයවැයෙන් දක්වා ඇති දර්ශකයකට අනුව බදු අය කිරීමේ ප්‍රතිපත්තිය මත පදනම්ව බදු වැඩි කිරීම මගින් දුම්වැටි බදු ආදායම තව රුපියල් බිලියන 20කින් ඉහල දමා ගත හැක. . (මෙම ඇස්තමේන්තුව පදනම් වී ඇත්තේ 2018 දත්ත මත වන අතර, 2019 සිට අවශ්‍ය සියලුම දත්ත මෙම විශ්ලේෂණය මුද්‍රණය කරන අවස්ථාවේ දී ද ලබා ගත නොහැකි විය).

දළ දේශීය නිෂ්පාදිතයෙන් 10% කට වඩා වැඩි අයවැය හිඟයක් රජය අපේක්ෂා කරන මොහොතක, කෝවිඩ් 19 අවදානම අවම කිරීමට ගත් පියවර හේතුවෙන් ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින පුද්ගලයන්ට සහන සැලසීමට ප්‍රයෝජනයට ගත හැකි මෙම ආදායම, ලබා ගන්නට කටයුතු නොකිරීම ආර්ථික වශයෙන් මෙන්ම සදාචාරාත්මක වශයෙන්ද ගැටළු සහගත ය.

කෙසේ වෙතත්, ආදායම් නිසා ඇතිවන බලපෑම් සඳහා වූ විසඳීම් මගින් පමණක් බදුකරණ ගැටළුව විසඳෙන්නේ නැත. ආදේශන නිසා ඇතිවන බලපෑම් ද සලකා බැලිය යුතුය. එසේම ඉහත බිලියන 20 ගණනය කිරීම පදනම් වී ඇත්තේ සියලූ දුම්වැටි වෙළඳ නාම සඳහා  දර්ශකයකට අනුව බදු අය  කිරීම මත වන අතර එහි දී ආදේශන නිසා ඇතිවන බලපෑම් ද සලකා බලා ඇත.

## ආදේශන නිසා ඇතිවන බලපෑම් යනු මොනවා ද, එම බලපෑම් දුම් වැටි බදු තීරණයට මග පෙන්වන්නේ කෙසේද?

පුද්ගලයෙකුගේ දුම්වැටි පරිභෝජනය ඒවා මිලදී ගැනීමේ ශක්තිය මත පමණක් නොව, දුම්වැටි වල සාපේක්ෂ මිල මත ද තීරණය වේ. මිලදී ගැනීමේ හැකියාව පහළ වැටුන ද, සාපේක්ෂ මිල අඩු තරඟකාරී පරිභෝජන විකල්ප පරිභෝජනයට පුද්ගලයෙකු නැඹුරු විය හැකිය. එනම්, සාපේක්ෂව ඉහළ මිලක් ඇති භාණ්ඩයක් පරිභෝජනය කිරීම වෙනුවට අඩු මිලට ඇති භාණ්ඩයක් ආදේශකයක් ලෙස පරිභෝජනය කිරීමට මිනිසුන් නැඹුරු වීමයි. මෙම නැඹුරුව ආදේශන නිසා වන බලපෑම ලෙස හඳුන්වයි. මෙයින් අදහස් වන්නේ තරඟකාරී භාණ්ඩ දෙකෙහිම නිරපේක්ෂ මිල ඉහල ගියද, එම භාණ්ඩ දෙක අතර සාපේක්ෂ මිල වෙනස වැඩි නම්,  ආදේශන නිසා වන බලපෑම සාපේක්ෂව මිල අඩු භාණ්ඩය පරිභෝජනයට බලපාන බවයි.

ප්‍රතිපත්ති සම්පාදකයන් ලංකාවේ දුම්වැටි වෙළඳ පොලෙහි, මෙම ආදේශන නිසා වල බලපෑම ප්‍රබල වීමට  දෙයාකාරයකට ඉඩ දී ඇත. පළමු ආකාරය වන්නේ දිගින් අඩු දුම්වැටි සඳහා අඩු බද්දක් පැනවීම හරහා විවධ වෙළඳ නාම යටතේ විවධ මිල ගණන් වලට දුම් වැටි නිෂ්පාදනයට ඉඩ ලබා දීමයි. දෙවන ආකාරය වන්නේ විවිධ දිගින් යුතු දුම්වැටි සඳහා සමානුපාතිකව බදු වැඩි නොකිරීම නිසා, මිල අඩු හා මිල අධික දුම්වැටි අතර මිල පරතරය ඉහල යාමට ඉඩ දීමයි.

වෙළඳපල ප්‍රමුඛයා වන JPGL යනු පසුගිය වසර 20 තුළ වෙළඳපල කොටසෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් හිමි දුම්වැටි සන්නාමය සහිත දිගින් වැඩි (හා ඒ නිසා වඩා මිල අධික) දුම්වැටි වර්ගය කි. එබැවින්, විවිධ වර්ගයේ දුම්වැටි අතර මිල පරතරය වැඩි වුවහොත්, කෙටි දුම්වැටි සාපේක්ෂව ලාභදායී වන අතර, ඍණාත්මක ආදායම් බලපෑම් නොසලකා (බදු සහ මිල වැඩි කිරීමෙන්) ඒවා ආදේශනය කිරීමට පාරිභෝගිකයින් දිරිමත් කෙරේ. කෙටි දුම්වැටි සඳහා අඩුවෙන් බදු අය කරන බැවින්, ආදේශන නිසා ඇතිවන මෙම බලපෑම හේතුවෙන් රජයට බදු ආදායම අහිමි වේ (මිනිසුන් දිගු දුම්වැටිවල සිට කෙටි දුම්වැටි වෙත මාරු වන බැවින්). දුම්වැටි නිෂ්පාදකයා විසින්ද මිල අධික දිග දුම් වැටිවලට සාපේක්ෂව මිල අඩු කෙටි දුම් වැටි වලට පාරිභෝගිකයා මාරු වීමේ ප්‍රවනතාව දිරිමත් කරන ආකාර යෙන් සිය නිෂ්පාදන සහ අලෙවිකරණ උපාය මාර්ග උපයෝගී  කර ඇති නිසා මෙම සංසිද්ධිය පසුගිය වසර දෙක තුළ දත්තවල දැකිය හැකි ය.

අතීතයේ දී අඩු ආදායම්ලාභීන් අතර ජනප්‍රියව තිබූ බීඩි නැවත වරක් දුම්වැටි වෙනුවට ආදේශකයක් ලෙස භාවිතය වීමේ අවදානම පිළිබඳව ශ්‍රී ලංකාවේ ඒකාධිකාරී දුම්වැටි නිෂ්පාදකයා විසින් අනතුරු අඟවා තිබේ හේතු දෙකක් නිසා, බීඩි පරිභෝජනය වැඩි වීමේ අවදානම අධිතක්සේරුවක් ලෙස සැලකිය හැකිය.. පළමුවෙන්ම, බීඩි පරිභෝජනය පසුගිය අවුරුදු 20 තුළ වර්ධනය වන බවක් නොපෙනේ - ඇතැම්විට මෙයට හේතුව, බීඩි යනු, දුම්වැටි පරිභෝජයනය කරන්නට බැරි තරම් දුප්පත් නම් පමණක් පරිභෝජනය කරන "බාල භාණ්ඩයක්" ලෙස සමාජයේ පිළිගැනීමකට ලක්ව තිබීම විය හැක.

දෙවනුව, පෙර විශ්ලේෂණයක (සිගරට් බද්ද පිළිබඳ නොමඟ යවන සුළු, සාවද්‍ය තොරතුරුවලට වගකිවයුත්තේ කවුරුන්ද?, 2017 ජූලි) පෙන්වා දී ඇති පරිදි, වෙළඳපොලේ බහුතරයක් තවමත් සාපේක්ෂව දිගු හා මිල අධික දුම්වැටි පරිභෝජනය කරන බැවින්, ආදේශන බලපෑම් සඳහාවන ප්‍රබලතම නැඹුරුව තිබෙන්නේ, සාපේක්ෂව අඩු මිලකට වෙනත් වෙළඳ නාම යටතේ අලෙවි වන දුම් වැටි වෙතටය.

දෙවනුව, පෙර විශ්ලේෂණයක (සිගරට් බද්ද පිළිබඳ නොමඟ යවන සුළු, සාවද්‍ය තොරතුරුවලට වගකිවයුත්තේ කවුරුන්ද?, 2017 ජූලි) පෙන්වා දී ඇති පරිදි, වෙළඳපොලේ බහුතරයක් තවමත් සාපේක්ෂව දිගු හා මිල අධික දුම්වැටි පරිභෝජනය කරන බැවින්, ආදේශන බලපෑම් සඳහාවන ප්‍රබලතම නැඹුරුව තිබෙන්නේ, සාපේක්ෂව අඩු මිලකට වෙනත් වෙළඳ නාම යටතේ අලෙවි වන දුම් වැටි වෙතටය.

බොහෝ විට ප්‍රතිපත්ති සම්පාදකයින් කරන ලද වැරැද්දක් වන්නේ බීඩි ආදේශකයක් ලෙස භාවිතා කිරීම නිසා අහිමි වන කුඩා බදු ආදායම රැක ගැනීමට වැඩි අවධානයක් යොමු කරමින්, මිල අධික දුම්වැටි වල සිට මිල අඩු දුම්වැටි වලට පරිභෝජනය ආදේශනය වීම නිසා වන විශාල බදු ආදායමක් අහිමි කර ගැනීමයි.

## මිල අඩු දුම්වැටි ආදේශකයක් ලෙස භාවිතය නිසා රජයට බදු ආදායම අහිමි වේ

JPGL වෙත සමීප ආදේශකයක් ලෙස දැන් ප්‍රවර්ධනය කරනු ලබන දුම්වැටි සඳහා අය කරන බද්ද, JPGL වෙළඳ නාමය යටතේ අලෙවි කරන දුම්වැටි බද්දෙන් 65% ක් පමණි. ලාභම දුම්වැටි වර්ගය සඳහා වන බද්ද JPGL සඳහා වන බද්දෙන් 37% ක් පමණි. එනිසා, දර්ශකයකට අනුව බදු අය කිරීමේ ප්‍රතිපත්තිය, වැඩිපුරම අලෙවි වන දුම්වැටි වර්ගයට පමණක් සීමා වෙමින්, ආදේශන නිසා වන බලපෑම සැලකිල්ලට නොගෙන ක්‍රියාත්මක කළහොත්, බදු වැඩි කලද, රජයට ඒ හරහා ලැබිය යුතු බදු ආදායම අහිමි වීමට ඉඩ ඇත.

ආදේශන නිසා වන අහිතකර බලපෑම ඉවත් කිරීමට නම් මිල අඩු දුම්වැටි වර්ග සඳහා වන බදු අඩු කිරීම, එම දුම් වැටි වල සාපේක්ෂ දිගට අනුකූලව සිදු විය යුතුය. බිලියන 20 ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත්තේ මෙම ක්‍රමය උපයෝගී කර ගනිමිනි.

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් පිළිපදින්නේ නම්, දුම්වැටි බදු අය කිරීමෙන් රජයේ ආදායම අඩු කර විය හැකි ආදේශන නිසා වන අහිතකර බලපෑම අවම වන ලෙසට, මිල අඩු දුම්වැටි වලට බදු පැනවීමට ක්‍රියා කල යුතුය. ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් ද ලබා දුන් උපදෙස් මගින්ද මේ බව අවධාරණය කර ඇත.

රජය, මූල්‍ය සහ සෞඛ්‍ය අර්බුදයට මුහුණ දෙන්නට, තවත් ණය ගන්නට සැලසෙන මේ වෙලාවේ, දුම් වැටි බදු සම්බන්ධ ප්‍රවීනත්වයකින් යුතු ජාත්‍යන්තර මෙන්ම දේශීය බලධාරීන් විසින් ලබා දෙන උපදෙස් පිළිපැදීම තුලින් මුදල් අමාත්‍යංශයට, ජනගහනයේ සෞඛ්‍යය සහ ආර්ථිකයේ සෞඛ්‍යය යන දෙකම වැඩිදියුණු කිරීමට දායක විය හැකිය.

රූපය 1: JPGL දුම්වැටි මිලදී ගැනීම හැකියාව (1980-2019) - ගණනය කරන ලද්දේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයෙන් මිල දී ගත හැකි සංඛ්‍යාව ලෙසය.

